අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ හිටපු අධ්‍යක්ෂ ශානි අබේසේකරව සැක පිට අත්අඩංගුවට ගැනීම හා සම්බන්ධ ප්‍රවෘත්ති දිගින් දිගටම මාධ්‍ය ඔස්සේ වාර්තා වනු දක්නට ලැබිණි. මේ අතර "ඔක්කොම හිරේ දාලා ශානි අන්තිමට හිරේ ගිය හැටි" යන සිරස්තලයෙන් යුතුව දිවයින පුවත්පත මගින් පළ කරන්නට යෙදුණු ලිපියක් වෙතද අපගේ අවධානය යොමු විණි.

මෙම ලිපියේ එක් තැනක සඳහන් කෙරෙන්නේ ශානි අබේසේකර නීතිය ඉදිරියේ සැකකරුවෙකුව සිටිනා බැවින් මෙතෙක් පැවසූ දැට එහා යමක් ඒ සම්බන්ධයෙන් සටහන් නොකරන බවයි. කෙසේ වෙතත් "ශානි අබේසේකර නම්වූ පච්කාර පොලිස්කාරයා", "නීතිය අතට ගෙන ඕනෑම කුණු වැඩක් කිරීම හමුවේ එක් වසරක් තුළ ජ්‍යෂ්ඨ පොලිස් අධිකාරීවරයෙකු දක්වා උසස්වීම් ලබමින් තරුපටි පැළඳි ශානි අබේසේකර..." යනාදී හැඳින්වීම්ද මෙම ලිපිය තුළ දැක්වේ.

මේ ඔස්සේ අපට ඇසීමට ඇත්තේ එක් පැනයකි. මෙම ලිපිය තුළද සඳහන් වන ආකාරයට ශානි අබේසේකර යනු නීතිය ඉදිරියේ තවමත් සැකකරුවෙකු පමණක් නොවේද? එසේ වේ නම් එම ලිපිය ඔස්සේම මේ සිදුකෙරෙන්නේ සැකකරුවෙකුව අපරාධකරුවෙකු ලෙසින් චිත්‍රණය කිරීමක් නොවේද? මේ සම්බන්ධයෙන් ඔබේ අදහස් මොනවාද?

#MediaEthicsSL #lka #Divaina #SinhalaPress